**ශීර්ෂය 310 - රජයේ කර්මාන්ත ශාලාව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

**------------------------------------------------------------------------------------------------**

ශීර්ෂය 310 - රජයේ කර්මාන්ත ශාලාවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, වාණිජ අත්තිකාරම් ගිණුම, ගබඩා අත්තිකාරම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ *කළමනාකරණ* විගණන වාර්තාව 2017 අගෝස්තු 4 දින රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**------------------------------------------------------------------------------------------------**

විසර්ජන ගිණුම, වාණිජ අත්තිකාරම් ගිණුම, ගබඩා අත්තිකාරම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**-------**

**2.1 විසර්ජන ගිණුම**

**-----------------**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

**---------------------------**

රජයේ කර්මාන්ත ශාලාව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 142.32 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 128.34 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රජයේ කර්මාන්ත ශාලාව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 13.98 ක් හෙවත් සියයට 9.82 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත පරිදි වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 90.63 | 76.97 | 13.66 | 15.07 |
| මූලධන | 51.69 | 51.37 | 0.32 | 0.62 |
| **එකතුව** | **142.32** | **128.34** | **13.98** | **9.82** |

## 2.2. අත්තිකාරම් ගිණුම්

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

රජයේ කර්මාන්ත ශාලාවට අදාළ විෂය අංක 31001 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 27.00 | 26.11 | 21.00 | 28.59 | 120.00 | 82.09 |

### 2.2.2 ගබඩා අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

රජයේ කර්මාන්ත ශාලාව විසින් පවත්වා තිබුණු විෂය අංකය 31002 දරන ගබඩා අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 80.00 | 76.99 | 80.00 | 113.80 | 40.00 | 33.35 |

### 2.2.3 වානිජ අත්තිකාරම් ගිණුම

**(අ) පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

රජයේ කර්මාන්ත ශාලාව විසින් පවත්වා තිබුණු විෂය අංකය 31003 දරන කළ වැඩ අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 315.00 | 307.50 | 320.00 | 352.15 | 180.00 | 126.92 |

(ආ) **මූල්‍ය ප්‍රතිඵලය**

-----------------

රජයේ කර්මාන්ත ශාලාව විසින් පවත්වා තිබුණු විෂය අංකය 31003 දරන කළ වැඩ අත්තිකාරම් ගිණුමේ මූල්‍ය ප්‍රතිඵල පහත පරිදි විය.

| **අත්තිකාරම් ගිණුම් කටයුත්ත** | **මූල්‍ය ප්‍රතිඵල** | | | |
|---|---|---|---|---|
| | **2016** | | **2015** | |
| | **ලාභය/(පාඩුව) කල්පිත ගාස්තු රහිතව** | **ලාභය/(පාඩුව) කල්පිත ගාස්තු සහිතව** | **ලාභය/(පාඩුව) කල්පිත ගාස්තු රහිතව** | **ලාභය/(පාඩුව) කල්පිත ගාස්තු සහිතව** |
| | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** |
| කළ වැඩ අත්තිකාරම් ගිණුම | 9.60 | 9.40 | 4.29 | 4.09 |

**2.3**

**අග්‍රීම ගිණුම**

---------------

රජයේ කර්මාන්තශාලාව යටතේ වූ අංක 7002/0000/00/0043/0016/000 දරන අග්‍රීම ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. මිලියන 39.08 ක් වී තිබුණි.

**2.4 විගණන නිරීක්ෂණය**

---------------------

රජයේ කර්මාන්ත ශාලාවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, වාණිජ අත්තිකාරම් ගිණුම, ගබඩා අත්තිකාරම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමණාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

---------------------------------------------

**3.1 ලේඛන හා පොත්පත් යාවත්කාලීන නොකිරීම**

-------------------------------------------------

කර්මාන්ත ශාලාව විසින් මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි.

**3.2 විසර්ජන ගිණුම**

-----------------

**ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹීම**

------------------------------------------

මුදල් රෙගුලාසි 94(1) පටහැනිව වැය විෂයයන් 03 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරිය ඉක්මවා රු.1,048,390 ක බැරකම්වලට එළඹ තිබුණි.

## 3.3 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම

-----------------------------------------

විෂය අංකය 31001 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.3,063,057 ක්වූ අතර, එම හිඟහිටි ණය ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 14 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණත්, එම හිඟ හිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) අත්තිකාරම් පිළිබඳ පාලන ගිණුමේ දැක්වෙන ගැලපුම් නොකළ රු.20,109 ක් සම්බන්ධයෙන් තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 3.4 කළවැඩ අත්තිකාරම් ගිණුම

---------------------------

විෂය අංක 31003 දරන කළ වැඩ අත්තිකාරම් ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඉදිරිපත් කළ ගිණුම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2014 වර්ෂයේ දී නිකුත් කරන ලද රු. 7,846,000 ක් වටිනා විකුණුම් ඉන්වොයිස් පතක් 2015 වර්ෂයේදී අත්තිකාරම් ලැබීම් ලෙස වැරදි ලෙස ගිණුම්ගත කිරීම සමාලෝචිත වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. 2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල එය නොපියවූ අත්තිකාරම් ලෙස සඳහන් කර තිබුණි.

(ආ) පසුගිය වර්ෂයේ ගබඩා අත්තිකාරම් ගිණුමට ආපසු හරවා යවන ලද ද්‍රව්‍ය වටිනාකම රු.971,849 කින් වැඩියෙන් සටහන් කිරීම නිසා එම වර්ෂයේ ලාභය වැඩියෙන් දක්වා තිබුණි. එම වරද සමාලෝචිත වර්ෂයේ දීද නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානට ණයගැති ශේෂය රු 583,387,666 ක් වූ අතර ගිණුම සමග ඉදිරිපත් කරන ලද උපලේඛන අනුව ර,,524,514.039 ක්වී තිබුණි . ඒ අනුව රු,863,151544 ක ණයගැතියන් සඳහා උපලේඛන ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) 2016 ජනවාරි 06 දිනැති අංක 248/2016 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව කාර්තුමය වශයෙන් ගැලපූ එකතු කළ අගය මත බදු දේශීය ආදායම් කොමසාර්ස් ජනරාල් වෙත ප්‍රේෂණය කළ යුතු වුවත්, කර්මාන්ත ශාලාව විසින් 2016 දෙසැම්බර් 31 දින වන විට දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කළ යුතු රු.162,753,536 ක එකතු කළ අගය මත බදු ප්‍රේෂණය නොකර කර්මාන්ත ශාලාවේ රඳවා ගෙන තිබුණි.

(ඉ) මුදල් රෙගුලාසි 509 ප්‍රකාරව කළවැඩ අත්තිකාරම් ගිණුමට අදාළව අංක 6000/0000/00/0008/0046/000 දරන ක්ෂය සංචිත අරමුදල යටතේ වූ රු.24,032,253 ක ශේෂය යාවත්කාලීන කිරීමෙකින් තොරව වර්ෂ ගණනාවක සිට අක්‍රීයව පැවැතුණි.

## 3.5 පොදු තැන්පත් ගිණුම

කර්මාන්ත ශාලාවේ වර්ෂ දෙකකට වැඩි කාලයක සිට පැවැත එන රු.15,000 ක්වූ ටෙන්ඩර් තැන්පතු සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 3.6 අභ්‍යන්තර විගණනය

දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි.

## 3.7 කාර්යසාධනය

2016 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම අනුව රු.මිලියන 510 ක් වු ව්‍යාපෘති 13 ක් සමාලෝචිත වර්ෂයේදී සම්පූර්ණයෙන් නිම කිරිමට සැලැසුම් කර තිබුණි. ඉන් ව්‍යාපෘති 04 ක් පමණක් නිම කර තිබුණි. ව්‍යාපෘති 05 ක් සියයට 50 ක ප්‍රමාණයක් නිම කර තිබුණු අතර, ව්‍යාපෘති 04 ක් සියයට 45 කට අඩුවෙන් නිම කර තිබුණි. මේ අනුව 2016 වර්ෂයේ කාර්යසාධනය සමස්ත වශයෙන් ඉතා පහළ මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.

## 3.8 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 31 | 20 | 11 |
| (ii) | තෘතියික මට්ටම | 10 | 03 | 07 |
| (iii) | ද්විතියික මට්ටම | 197 | 114 | 83 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 552 | 321 | 231 |
| | **එකතුව** | **790** | **458** | **332** |